**නාමල්ඔය ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 6 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 06 දින සභාවේ ලේකම්වරයාට යවන ලදී.

### 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට නාමල්ඔය ප්‍රදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මුද්දර ගාස්තු ලේඛනය අනුව හිඟ මුද්දර ගාස්තුව රු. 346,204 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ මුද්දර ගාස්තු ආදායම ලෙස ශේෂ පත්‍රයේ රු.254,204 ක් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලෙජරය අනුව හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තු ආදායම රු. 19,900 ක් වුවද, එය ශේෂ පත්‍රයේ දක්වා නොතිබුණි.

#### 1.3.2 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම්.

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති සහ රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| **(අ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත** | |
| 150 (4) වගන්තිය | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තු රු. 19,900 ක් අයකර ගැනීම සඳහා ප්‍රාදේශිය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| **(ආ) ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති මාලාව** | |
| (i) රීති - 62 | ලේකම්වරයා විසින් කර්මාන්ත බද්ද ගෙවන ලෙස නිවේදන නිකුත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) | රීති - 180 | මුදල්, ගබඩා හා ආදායම් එකතු කිරීමේ කටයුතු භාරව ක්‍රියා කරන නිලධාරීන් තිදෙනා විසින් ඇපකර ඉදිරිපත් කර නොතිබුණි. |

**(ඇ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි**

| | | |
|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 757 (2) | සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපතිට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 1647 (ඉ) | මෝටර් වාහන ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කර ඇති ගිණුම් අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශිය සභාවේ වැඩ කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,648,618 ක් වූ අතර, එයට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.406,615 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,242,003 ක වර්ධනයක් පෙන්නුම් කෙරේ.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය පිළිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ.

(අ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ බලපත්‍ර ගාස්තු ආදායම, බදුකුලී ආදායම හා වෙනත් ආදායම සියයට 25 සිට සියයට 66 දක්වා පරාසයක වර්ධනයක් පෙන්නුම් කල අතර, සේවා සඳහා ගාස්තු, වරෙන්තු ගාස්තු හා දඩ මුදල් ආදායම සියයට 12 සිට සියයට 30 දක්වා පරාසයක පසුබෑමක් නිරීක්ෂණය විය.

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වැටුප් හා දීමනා, සැපයුම් හා උපකරණ හා ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව සඳහා වියදම් සියයට 41 සිට සියයට299 දක්වා පරාසයක වැඩිවීමක් පෙන්නුම් කෙරේ.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| (i) කුළී | 923 | 1,230 | 4 |
| (ii) බලපත්‍ර ගාස්තු | 381 | 315 | _ |
| (iii) සේවා සඳහා ගාස්තු | 85 | 59 | _ |
| (iv) වරෙන්තු ගාස්තු හා දඩ | 708 | 691 | 111 |
| (v) වෙනත් ආදායම | 1,164 | 219 | 254 |

**2.3.2 මුද්දර ගාස්තු**

2014 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු රු.346,204 ක් රෙජිස්ටාර් ජනරාල්වරයාගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පලාත් පාලන අමාත්‍යාංශය විසින් සභාව වෙත ලබාදුන් වාහන 05 ක අයිතිය පවරා ගැනීමට අවශ්‍ය ක්‍රියා මාර්ග 2015 මාර්තු 23 විටත් ගෙන නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශය තුල පවත්වා ගෙන යන වී මෝල් 36 ක් පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 139 ප්‍රකාරව චෙක්පත් මඟින් කෙරෙන සියළු ගෙවීම් සඳහා තම බැංකු ශේෂය ප්‍රමාණවත් දැයි ගෙවන නිලධාරියා විසින් සොයා බැලිය යුතු වුව ද, සභාවේ නෙල්ෂිප් ගිණුමට අදාල මුදල් පොතේ ශේෂය රු. 706,251 ක ඍණ ශේෂයක් වන පරිදි 2014 ජූනි මස චෙක්පත් ලියා තිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාවේ සේවය කරමින් සිට ස්ථාන මාරුවී ගිය නිලධාරියකුගෙන් 2007 මැයි සිට අයවිය යුතු රු. 39,988 ක ණය මුදලක් හා නිලධාරීන් දෙදෙනෙකුගෙන් 2011 ජනවාරි සිට අයවිය යුතු එකතුව රු. 1,600 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) බැංකු ගිණුමකට අදාලව බැංකුව විසින් 2011 වර්ෂයේ වැරදීමකින් හර කරන ලද රු. 23,000 ක මුදල අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන දින වන විටත් කටයුතු කර නොතිබුනි.

(ඇ) දෙහිඅත්තකණ්ඩිය කලාප අධ්‍යාපන කාර්යාලයට ස්ථාන මාරුවී ගිය කළමණාකරණ සහකාර නිළධාරිගෙන් අයවිය යුතු රු.38,388 ක ණය මුදල කලාප කාර්යාලය අදාල නිළධාරියාගෙන් අයකර ගෙන තිබුණ ද, එම මුදල සභාවට ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.3 ඌන උපයෝජිත වත්කම්

2014 දෙසැම්බර් මස හා 2015 පෙබරවාරි මස යන කාලය තුල පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් සභාවට ලබාදෙන ලද ලියාපදිංචි නොකල වාහන 05 ක් ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය වන ලියකියවිලි විගණන දින වූ 2015 මාර්තු 12 වන විටත් අමාත්‍යාංශයෙන් සභාවට ලබාදී නොතිබූ බැවින් භාවිතා කිරීමකින් තොරව ගාල්කර තිබුණි.

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත සහ තථ්‍ය වියදම අතර සියයට 20 සිට සියයට 109 දක්වා පරාසයක විචලනයන් පැවති බැවින් අයවැය ලේඛණය සඵල කළමණාකරන පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 5. පද්ධති හා පාලන.

පහත සඳහන් පද්ධති හා පාලන සම්බන්ධ ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය